ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

අදියර III විභාගය - ජූලි 2023

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** විගණන කමිටුවෙහි කාර්භාරයන් තුනක් සඳහන් කිරීමට අවශ්‍ය විය.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමේ විය. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතාවය තේරුම් ගත් නමුත් පහත පරිදි අදාළ නොවන පිළිතුරු සපයන ලදී:

- ගිණුම් අනුමත කිරීම සහ නිවැරදි කිරීම.
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී විගණකවරයාට උපදෙස් දීම.
- මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහසක් ප්‍රකාශ කිරීම.
- මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.

ප්‍රශ්නයේ **(b) කොටසින්** විගණන කමිටුව විසින් අධ්‍යක්ෂක මණ්ඩලයට ලබා දිය හැකි ප්‍රතිලාභ දෙකක් හඳුනා ගැනීමට අවශ්‍ය විය.

කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුනි. බොහෝ අයදුම්කරුවන් විසින් පහත පරිදි සාමාන්‍ය පිළිතුරු ලබා දී තිබුණි.

- ඵලදායී බව සහ කාර්යක්ෂමතාවය පවත්වා ගැනීම.
- ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් හඳුනා ගැනීම.
- මගපෙන්වන්නෙකු ලෙස කටයුතු කිරීම, ආදිය.

පහත සඳහන් කරුණු කෙරෙහි දැනුම වැඩි දියුණු කර ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- විගණන කමිටුවේ සංයුතිය.
- විගණන කමිටුවේ කාර්යයන්.
- විගණන කමිටුවේ ප්‍රතිලාභ.
- විගණන කමිටුවක ගැටළු.

## ප්‍රශ්න අංක 02

**සීමාසහිත ග්ලෙන්රොක් (පුද්ගලික) සමාගමෙහි** හඳුනාගත් අවදානම් අවම කිරීම සඳහා භාවිතා කළ හැකි ශිල්ප ක්‍රමයක් බැගින් පැහැදිලි කිරීමට මෙම ප්‍රශ්නයෙන් දක්වා තිබුණි.

බොහෝ අයදුම්කරුවන් අවදානම් අවම කිරීම සඳහා භාවිතා කරන ශිල්පීය ක්‍රම සඳහන් කර තිබූ නමුත් සමාගමේ අධ්‍යක්ෂවරයාගේ සැලකීම  සමඟ ගැලපීමට අපොහොසත් වූ අතර එම නිසා පහත කරුණු  සඳහන් කර තිබුණි:

- අවදානම් වළක්වා ගැනීම.
- අවදානම් පිළිගැනීම.
- අවදානම් මාරු කිරීම.
- අවදානම් අවම කිරීම.

අයදුම්කරුවන් විසින් අවදානම් වර්ගය හඳුනාගැනීමත්,  සුදුසු අවදානම් අවම කිරීමේ ක්‍රමවේද ඉදිරිපත් කිරීමත් කළ යුතුව තිබුණි. බොහෝ අයදුම්කරුවන්ට වලංගු උදාහරණ සමඟ ශිල්පීය ක්‍රම පැහැදිලි කිරීමට නොහැකි විය.

උදා:  - අවදානම් මාරු කිරීම - රක්ෂණ ඔප්පුව.
- අවදානම් වළක්වා ගැනීම - වසා දැමීම.
- අවදානම් අඩු කිරීම - මෙහෙයුම් විවිධාංගීකරණය.

පහත සඳහන් ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ දැනුම වැඩි දියුණු කර ගැනීමට අයදුම්කරුවන්හට උපදෙස් දෙනු ලැබේ.

- සංවිධානයේ බාහිර හා අභ්‍යන්තර අවදානම්.
- අවදානම් කළමනාකරණ රාමුව.
- අවදානම අවම කිරීම සඳහා භාවිතා කරන තාක්ෂණික ක්‍රම.
- අවදානම් කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය.

## ප්‍රශ්න අංක 03

සහතික කිරීමේ කාර්යභාරයක් භාරගැනීමේදී සහ කළමනාකරණය කිරීමේදී අදාළ වන ප්‍රධාන පැතිකඩයන් තුනක් සහ අවශ්‍යතාවයන් තුනක් පැහැදිලි කිරීමට මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමේ විය.

මෙය සරල ප්‍රශ්නයක් වන අතර ඍජු පිළිතුරු දිය හැකිව තිබුණි. ස්ව-අධ්‍යයන පොත මඟින් සහතික කිරීමේ කාර්යභාරයක් පිළිගැනීමට සහ කළමනාකරණයට අදාළ අංශ සහ අවශ්‍යතා කිහිපයක් දක්වා ඇත.

සමහර අයදුම්කරුවන් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සපයා අඩු ලකුණු ලබා ගත්හ:

උදා:  - තහවුරු කිරීමේ ලිපි කැඳවීම, විමසීම්, පරීක්ෂා කිරීම් වැනි සාමාන්‍ය විගණන ක්‍රියා පටිපාටි.

- මෙහෙයුම් වල ඵලදායී බව සහ කාර්යක්ෂමතාවය.

- නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම.

## ප්‍රශ්න අංක 04

විගණන ආයතනයක තත්ත්ව පාලන පද්ධතියක ප්‍රධාන මූලිකාංග දෙකක් පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය.

මෙම ප්‍රශ්නය ද සරල ප්‍රශ්නයක් වූ අතර ස්ව-අධ්‍යයන පාඩම් මාලාව තුල තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග උදාහරණ සමඟින් මූලිකාංග හයක් පැහැදිලිව විස්තර කරයි.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමේ විය. බොහෝ අයදුම්කරුවන් මූලිකාංග හඳුනාගෙන තිබුණත් ඒවා පැහැදිලි කර නොතිබුණි. මෙයට හේතුව මූලිකාංග පිළිබඳ ඔවුන්ගේ දුර්වල අවබෝධයයි.

සමහර අයදුම්කරුවන් මූලිකාංග පිළිබඳ සාමාන්‍ය පැහැදිලි කිරීම් සපයා තිබුණි. උදා: නායකත්වය, මානව සම්පත් හා ආචාර්ය ධර්ම. එබැවින්, විගණන විෂයපථය තුළ තත්ත්ව පාලන අංග පිළිබඳව සැලකියයුතු දැනුමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

තවද, පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන ලෙසටත් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

- තත්ත්ව පාලන පද්ධතියේ අරමුණු.
- තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග.
- මූල්‍ය ප්‍රකාශන විගණනයක් සඳහා අදාළ වන තත්ත්ව පාලන අවශ්‍යතා.
- විගණන කාර්යභාරයන් පිළිගැනීම සහ අඛණ්ඩව පවත්වාගෙන යාම සහ විගණන කටයුතු වලින් ඉවත් වීම.

# B කොටස

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** විෂය පථය සීමා කිරීමේ බලපෑම (භෞතික තොග සත්‍යාපනය සඳහා ආරාධනා නොකිරීම) සහ කළමනාකාරීත්වය සමඟ එකඟ නොවීම (විකුණුම් මිලට තොගයේ තක්සේරුව) පිළිබඳ සාකච්ඡා කිරීම අපේක්ෂා කෙරිනි.

කෙසේවෙතත්, සාවද්‍ය ප්‍රකාශනයේ බලපෑම සහ එය විගණක වාර්තාවට බලපාන ආකාරය හඳුනාගෙන තිබුණේ ඉතා සුළු අයදුම්කරුවන් පිරිසක් පමණි.

තොගය පිරිවැය හෝ ශුද්ධ උපල්බ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තක්සේරු කළ යුතු බව බොහෝ අයදුම්කරුවන් සඳහන් කර නොතිබූ අතර මින් පෙන්නුම් කරන්නේ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දුර්වල අවබෝධයයි.

භෞතික තොග සත්‍යාපනයට සහභාගී වීමට විගණකවරුන්ට නොහැකි වූ විට සිදු කළ හැකි විකල්ප විගණන ක්‍රියා පටිපාටි පිළිබඳව අයදුම්කරුවන්ට අවබෝධයක් නොතිබුණි.

**(b) කොටස** මගින් විගණකවරයෙකුගේ මතය ප්‍රකාශ කිරීමේදී සලකා බැලිය යුතු කරුණු හතරක් සඳහන් කිරීමට දක්වා තිබුණි.

මෙම කොටස සඳහා කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් සලකා බැලිය යුතු කරුණු වලට වඩා විගණන වාර්තාවේ මූලිකාංග සඳහන් කර තිබුණි.

උදා: - මාතෘකාව
- ලිපිනය
- අත්සන
- දිනය

මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ප්‍රශ්නයේ අවශ්‍යතා පිළිබඳ දුර්වල අවබෝධයයි. එබැවින්, ප්‍රශ්නයේ අවශ්‍යතාවය පිළිබඳව නිසි අවධානයෙන් ප්‍රශ්නය කියවන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. **(c) කොටසින්** වර්තමාන විගණන කටයුතු ආරම්භයේදී විගණකවරයා විසින් සිදු කළ යුතු මූලික කටයුතු පැහැදිලි කිරීමට දක්වා තිබුනි.

## ප්‍රශ්න අංක 06

නව සේවාදායකයකුගේ විගණනය භාරගැනීමේ හැකියාව තක්සේරු කිරීම ප්‍රශ්නයේ **(a) කොටසින්** අසා තිබුණි.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

නව සේවාදායකයකු පිළිගැනීමට පෙර, එවැනි පිළිගැනීමක් මූලික මූලධර්ම වලට අනුකූල වීම සඳහා යම් තර්ජනයක් ඇති කරයිද යන්න විගණකවරයෙකු විසින් තීරණය කළ යුතු බව අයදුම්කරුවන් ඉතා සුළු සංඛ්‍යාවක් සඳහන් කර තිබුණි.

බොහෝ අයදුම්කරුවන් සාමාන්‍ය මට්ටමින් පිළිතුරු ලබා දී ඇත:

- **ගුඩ් බෑන්ක් සමාගම** හානිකරණ අලාභ සඳහා වෙන් කිරීම් නොකර ඇති බැවින් විගණනය පිළි නොගත යුතුය.
- විකරණයන් (බලපෑම) එතරම් පෘථුල නොවන නිසා විගණනය පිළිගත යුතුය.

සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් තර්ජන වල බලපෑම පිළිගත හැකි මට්ටමකට අඩු කිරීම සඳහා යෙදිය හැකි ආරක්ෂණ ක්‍රම දක්වා නොතිබුණි.

**(b) කොටසින්** ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය පැහැදිලි කිරීමට අවශ්‍ය විය.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය. බොහෝ අයදුම්කරුවන් ප්‍රසිද්ධියේ සේවාදායකයෙකු සමඟ සමීප සම්බන්ධතාවයන් පවත්වා ගැනීම ස්වාධීනත්වය ප්‍රශ්න කිරීමට හේතු වන බව සඳහන් කර ඇත. කෙසේවෙතත්, බොහෝ අයදුම්කරුවන්ට මනසේ ස්වාධීනත්වය සහ පෙනුමේ ස්වාධීනත්වය පැහැදිලි කිරීමට නොහැකි විය.

පහත කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

- ස්වාධීනත්වය පිළිබඳ සංකල්පය
- ස්වාධීනත්වයට ඇතිවන තර්ජන
- ස්වාධීනත්වය ආරක්ෂා කිරීම

මූලික ප්‍රතිපත්තිවලට අනුකූල වීමේ තර්ජන සමඟින් ස්වාධීනත්වයට එල්ල වන තර්ජන වෙන්කර දැක්වීමට අයදුම්කරුවන් ප්‍රවේශම් විය යුතුය.

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයේ **(a) කොටසින්** බාහිර තහවුරු කිරීම් ලබා ගත යුතු සැපයුම්කරුවන් දෙදෙනෙකු හේතු සහිතව හඳුනා ගැනීමට අවශ්‍ය විය. කාර්ය සාධනය සතුටුදායක මට්ටමක තිබුණි. බාහිර තහවුරු කිරීම් ලබා ගැනීමට අවශ්‍ය සැපයුම්කරුවන් සැලකිය යුතු පිරිසක් හඳුනාගෙන තිබුණි.

බාහිර තහවුරු කිරීම් ලබා ගැනීම හැර වෙළඳ ණය හිමියන් විගණනය සඳහා සිදු කළ යුතු විගණන ක්‍රියා පටිපාටි තුනක් ලැයිස්තුගත කිරීමට (b) කොටසින් අවශ්‍ය විය.

මෙම කොටස සඳහා කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි. බොහෝ අසාර්ථක අයදුම්කරුවන් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු ලබා දී තිබුණි.

- නිරීක්ෂණ
- පරීක්ෂා කිරීම
- නැවත ගණනය කිරීම
- විමසීම්

(නිරීක්ෂණ, පරීක්ෂා කිරීම, නැවත ගණනය කිරීම — මේවා සාමාන්‍ය විගණන ක්‍රියා පටිපාටීන්ය)

පසුව ඇති වූ සිදුවීම් සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම පැහැදිලි කිරීම (c) කොටසින් අවශ්‍ය විය.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය. සමහර අයදුම්කරුවන් පසුව ඇති වූ සිදුවීම් සම්බන්ධයෙන් කළමනාකාරිත්ව වගකීම පැහැදිලි කර තිබුණු අතර තවත් සමහරක් පසුව ඇති වූ සිදුවීම් සම්බන්ධයෙන් විගණන ක්‍රියා පටිපාටි පැහැදිලි කර තිබුණි.

පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- පසුව ඇති වූ සිදුවීම් සම්බන්ධයෙන් විගණකගේ වගකීම
- විගණක වාර්තාවේ දිනට පෙර සිදුවීම්
- මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනට පෙර විගණක වාර්තාවේ දිනට පසු සිදුවීම්.
- මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමෙන් පසු සිදුවීම්.

## C කොටස

## ප්‍රශ්න අංක 08

**(a) සීමාසහිත D ෆැෂන් (පුද්ගලික) සමාගමෙහි** අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලකිය යුතු දුර්වලතාවයන් පිළිබිඹු කෙරෙන සංඥා තුනක් පැහැදිලි කිරීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි.

සමහර අයදුම්කරුවන් පහත පරිදි සාමාන්‍ය පිළිතුරු සපයා තිබුණි:

- දුර්වල අවදානම් තක්සේරුව.
- අභ්‍යන්තර පාලනයේ අකාර්යක්ෂම නිර්මාණය.
- හඳුනාගත් අවදානමට අකාර්යක්ෂම ප්‍රතිචාර.

ප්‍රශ්නයේ දී ඇති අවස්ථාව සඳහා අභ්‍යන්තර පාලනය පිළිබඳ ඔවුන්ගේ දැනුම භාවිතා කරන ලෙස අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**(b)** **සීමාසහිත D ෆැෂන් (පුද්ගලික) සමාගම** මගින් ක්‍රියාත්මක කළ හැකි පාලන ක්‍රියාකාරකම් තුනක් පැහැදිලි කිරීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවතිණි.

සමහරෙක් පහත පරිදි අදාළ නොවන පිළිතුරු සපයන ලදී,

- තත්ත්ව පාලනය.
- තොරතුරු සහ සන්නිවේදනය.
- අධීක්ෂණය.
- මුල්‍ය පාලනය.

බොහෝ අපේක්ෂකයින් **සීමාසහිත D ෆැෂන් (පුද්ගලික) සමාගමට** සම්බන්ධ නොකර පාලන ක්‍රියාකාරකම් පමණක් සඳහන් කර තිබුණි.

**(c)** **සීමාසහිත D ෆැෂන් (පුද්ගලික) සමාගම** වෙත යෝජනා කළ හැකි වැළැක්වීමේ පාලනයන් දෙකක් පැහැදිලි කිරීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමට වඩා අඩු විය.

බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතාවය (වැළැක්වීමේ පාලන) තේරුම් ගෙන නොතිබූ අතර අභ්‍යන්තර පාලනයට අදාළ සියලු පාලනයක් ලියා තිබුණි.

පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳව සාධාරණ දැනුමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- අභ්‍යන්තර පාලන වර්ග.
- සංවිධානය මත පදනම් වූ පාලන:
  - මෙහෙයුම්
  - මුල්‍ය
  - අනුකූල වීම
- හැසිරීම මත පාලනය:
  - වැළැක්වීම
  - හඳුනා ගැනීම
  - නිවැරදි කිරීම

**(d)** **සීමාසහිත D ෆැෂන් (පුද්ගලික) සමාගමට** අදාලව හඳුනාගත හැකි ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලි දෙකක් පැහැදිලි කිරීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක තිබුණි.

ප්‍රශ්නය සඳහා උත්සාහ කළ සියලුම අයදුම්කරුවන් පාහේ ව්‍යාපාර ක්‍රියාවලි ගැන සඳහන් කර තිබූ නමුත් ඔවුන්ගෙන් බහුතරයකට එම ක්‍රියාවලි සතුටුදායක මට්ටමින් පැහැදිලි කිරීමට නොහැකි විය.

එබැවින්, පහත සඳහන් දෑ පිළිබඳ මනා අවබෝධයක් ඇතිවන පරිදි ව්‍යාපාර ක්‍රියාවලීන් පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ:

- ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලීන්.
- ක්‍රියාවලි වල පියවර.
- එක් එක් ක්‍රියාවලියට අදාළ ප්‍රධාන ලේඛන ආදිය.

**(e)** භාණ්ඩ ලැබීම් පත්‍රවල (GRN) වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට භාවිතා කළ හැකි යෙදුම් පාලනයන් දෙකක් උදාහරණ සමඟ පැහැදිලි කිරීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතාවය නොසලකා හරිමින් තොරතුරු තාක්ෂණය සම්බන්ධ ලිඛිත පාලනයක් දක්වා තිබුණි.

තොරතුරු තාක්ෂණ පාලනයන්හි යෙදුම් සහ සාමාන්‍ය පාලනයන් අතර වෙනස්කම් සහ ඒවාට අදාල උදාහරණ සහිතව ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට  උපදෙස් දෙනු ලැබේ.

## ප්‍රශ්න අංක 09

**(a)** YF හි විගණන ක්‍රියා පටිපාටිය සිදු කිරීමේදී විශේෂ අවධානයක් අවශ්‍ය ක්ෂේත්‍ර පහක් හඳුනා ගැනීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්යසාධනය සාමාන්‍ය මට්ටමේ විය.

ලබා දී ඇති තොරතුරු විශේෂ අවධානය යොමු කළ යුතු බොහෝ ක්ෂේත්‍ර ඉස්මතු කරන බැවින් මෙය පිළිතුරු දීමට පහසු ප්‍රශ්නයක් විය. කෙසේවෙතත්, අයදුම්කරුවන් ප්‍රශ්නයේ අවශ්‍යතා සහ ප්‍රශ්නයේ දක්වා ඇති තොරතුරු තේරුම් ගෙන නොමැත.

සමහර අයදුම්කරුවන් පහත සඳහන් අදාළ නොවන පිළිතුරු සපයා තිබුණි:

- පොලී සහ උද්ධමන අනුපාතය.
- අභ්‍යන්තර  පාලනය.
- PEST සාධක.

**(b)** මූල්‍ය වාර්තාකරණයේ පවතින  සියලුම වැරදි  සහ වංචා හඳුනා ගැනීම විගණකගේ අරමුණ විය යුතු බව සඳහන් කරමින් ප්‍රධාන විධායක නිලධාරියා විසින් සිදු කරන  ලද ප්‍රකාශය තක්සේරු කිරීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්යසාධනය ඉතා දුර්වල විය.

සැලකිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාවක් සඳහන් කර තිබුණේ වංචා සහ වැරදි හඳුනාගැනීම විගණකගේ වගකීමක් බවයි. මෙයින් පෙන්නුම් කරන්නේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ අයදුම්කරුවන්ගේ දුර්වල තාක්ෂණික දැනුමයි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් ලබා ගැනීමට අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**(c)** ප්‍රශ්නයේ මෙම කොටසින් සුදුසු මිණුම් ලකුණක් මත පදනම්ව ප්‍රමාණාත්මකභාවය ස්ථාපිත කිරීම සඳහා බලපෑ හැකි සාධක හතරක් සඳහන් කිරීමට අවශ්‍ය විය.

කාර්යසාධනය ඉතා දුර්වල වූ අතර සමහර අයදුම්කරුවන් මෙම කොටස උත්සාහ කර නොතිබුණි. ලබා දී තිබු ඇතැම් අදාළ නොවන පිළිතුරු පහත පරිදි විය:

- සාක්ෂිවල ප්‍රමාණවත් බව සහ යෝග්‍යතාවය.
- විගණකවරුන්ගේ පළපුරුද්ද සහ ප්‍රවීණතාවය.
- අවසාන දින අවශ්‍යතාවය.
- සම්පත් ලබා ගැනීමේ හැකියාව.

**(d)** අස්තිත්වය සහ එහි පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී විගණකවරයා විසින් සලකා බැලිය යුතු කර්මාන්ත සහ නියාමන සාධක පහක් හඳුනා ගැනීමට මෙම කොටසින් අවශ්‍ය විය.

කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

බොහෝ අයදුම්කරුවන්ට අභ්‍යන්තර හා බාහිර ව්‍යාපාරික පරිසරයන් පිළිබඳව නිසි අවබෝධයක් නොතිබීම දුර්වල කාර්ය සාධනය සඳහා ප්‍රධාන හේතුව විය.

එබැවින්, අයදුම්කරුවන්ට වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට උපදෙස් දෙනු ලැබේ,

- කර්මාන්ත, නියාමන සහ අනෙකුත් බාහිර සාධක.
- ආයතනයේ ස්වභාවය.
- අභ්‍යන්තර පාලනය.
- අරමුණ, උපායමාර්ග සහ අදාළ ව්‍යාපාරික අවදානම.

**(e)** මෙම කොටසින් සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම සමාලෝචනය කිරීමේදී යොදාගත හැකි විගණන පටිපාටි හයක් දැක්වීමට අවශ්‍ය විය.

කාර්යසාධනය දුර්වල වූ අතර සමහර අයදුම්කරුවන් මෙම කොටසට පිළිතුරු දීමට උත්සාහ කර නොතිබුණි.

බොහෝ අයදුම්කරුවන් පහත පරිදි සාමාන්‍ය විගණන ක්‍රියා පටිපාටි දක්වා තිබුණි:

- විමසීම.
- පරීක්ෂා කිරීම.
- නැවත ගණනය කිරීම.
- බාහිර තහවුරු කිරීම, ආදිය.

\- - -

**<u>විභාගයේදී උත්තර ලිවීමේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අයදුම්කරුවන්ගේ නිපුණතා මට්ටම ඉහළ නැංවීම සඳහා යෝජනා:</u>**

- අයදුම්කරුවන් ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත අධ්‍යයනය කොට එහි අන්තර්ගතය මනාව වටහාගත යුතුය.
- විගණන විෂයට සම්බන්ධ ලිපි, පොත්පත්, සඟරා, ආදිය පරිශීලනය කළ යුතුය.
- ප්‍රශ්න පත්‍රයට අමුණා ඇති "කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව" පිළිබඳ නිර්වචන හරිහැටි තේරුම්ගෙන එපරිදි උත්තර ලිවීමට පුරුදු පුහුණු විය යුතුය.
- පසුගිය ප්‍රශ්නපත්‍ර වල අන්තර්ගත දැ අධ්‍යයනය කර, යටත් පිරිසෙයින් ඉකුත් විභාගවල ප්‍රශ්නවලටවත් උත්තර ලිවීමට පුරුදු වී, ප්‍රශ්න දී තිබෙන ආකාරය වටහා ගැනීමට උත්සාහ කළ යුතුය.
- ප්‍රශ්න පත්‍ර වල පරික්ෂා කර ඇති න්‍යායාත්මක කරුණු යොදා ගැනීම විභාගයේදී පරීක්ෂක විසින් අපේක්ෂා කර ඇත්තේ කෙසේද යන සම්බන්ධතාවය අයදුම්කරුවන් වටහාගත යුතුය.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ කවර ක්ෂේත්‍රවලින් පසුගිය ප්‍රශ්න දී තිබේදැයි කෙටි සටහන් ලියාගැනීම මඟින් අයදුම්කරුවන් තේරුම්ගත යුතුය.
- ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවලට කාලය වෙන්කරගෙන ඒ අනුව උත්තර ලියා පුරුදු වීමෙන් විභාගයේදී අයදුම්කරුවන්ගේ කාල කළමනාකරණය දියුණු වනු ඇත.
- ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොතේ එක් එක් පරිච්ඡේදය සඳහා කෙටි සටහන් පිළියෙල කරගෙන විවේක ලැබෙන විධියට විෂය නිර්දේශයේ අන්තර්ගත කරුණු මතකයට නඟා ගැනීම සිදුකළ යුතුය.
- අයදුම්කරුවන් කියවීමට හැකි ආකාරයෙන් අත්අකුරු පැහැදිලිව විභාගයේදී ලිවිය යුතුය.
- ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම පටන්ගැනීමට පෙර අයදුම්කරුවන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවා බැලිය යුතුය.
- ප්‍රශ්නය නිසිලෙස තේරුම් ගැනීමටත්, ඒවාට අවශ්‍යකරන යෝග්‍ය උත්තර නිවැරදිව ලිවීමටත් පැහැදිලි මානසික ඒකාග්‍රතාවයක් අයදුම්කරුවන් සතුවිය යුතුය.
- වෙන්කර ඇති ලකුණු මත පදනම්ව, ප්‍රශ්නවලට කාලය වෙන්කර ගැනීමෙන් ප්‍රශ්න පත්‍රයේ දී ඇති ප්‍රශ්න වලට එලදායී අන්දමින් උත්තර සැපයීමට අයදුම්කරුවන්ට හැකිවනු ඇත.
- ප්‍රශ්න පත්‍රයේ දී ඇති ආකාරයටම උත්තරවලද යෝග්‍ය පරිදි නිවැරදි ලෙස අංක යෙදිය යුතුය.
- න්‍යායයන් හා ඒවා ප්‍රශ්නයට යොදාගැනීම අතර සම්බන්ධය වටහා ගැනීම ඉතාමත් වැදගත්වන අතර, ඉල්ලා ඇති අවස්ථාවන්හි උදාහරණ සහිතව ලිවිය යුතුය.
- උත්තර පොත් බාර දීමට පෙර, අවශ්‍ය කරන ප්‍රශ්න සියල්ලටම උත්තර ලියා තිබේද, යෝග්‍ය පරිදි අංක යොදා තිබේදැයි දෙවරක් පරීක්ෂා කර බලන්න.

- * * * -